ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහන - 2020/2021
අවසාන පරීක්ෂණය - 2022
විශේෂ තත්ත්වයන් සහ ඉගෙනුම් අවශ්‍යතා පිළිබඳ හැඳින්වීම - SNP8334/ESP2134
කාලය - පැය තුනයි. (03)

---

දිනය - 2022.09.03 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

1 වන කොටසේ සියලුම ප්‍රශ්න වලටද 2 වන කොටසින් ඕනෑම ප්‍රශ්න තුනකටද (3) පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

01. සුදුසු උදාහරණ ආශ්‍රයෙන් පහත සඳහන් පද නිර්වචනය කරන්න.
    - ඌනතාවය
    - දුබලතාවය
    - බාධිතබව

02. දුබලතා සහිත ළමුන් සඳහා ඇමරිකා ජාතික ව්‍යාප්ති මධ්‍යස්ථානයට අනුව අධ්‍යාපනික සන්දර්භය තුළ දෘෂ්ටි ඌනතා සහිත සිසුන් විස්තර කිරීමට භාවිතා කරන පද නම් කරන්න.

03. ඔවුන්ගේ සහ ලක්ෂණය සහිත දරුවන්ගේ පොදු ලක්ෂණ පහක් (05) සඳහන් කරන්න.

04. ප්‍රාථමික පන්ති කාමරයේ සිසුන් අතර හඳුනාගත හැකි සෞඛ්‍ය ඌනතා පහක් (05) ලැයිස්තුගත කරන්න.

05. බුද්ධිමය දුබලතා ඇසුරු කොටගත් සහලක්ෂණ තත්ව හතරක් (04) නම් කර ඉන් එකක් පැහැදිලි කරන්න.

06. සහජ දක්ෂතා සහිත දරුවන්ගේ ගති ලක්ෂණ පහක් (05) සඳහන් කරන්න.

07. 'සුවිශේෂී ඉගෙනුම් දුබලතා' ඔබේ වචනයෙන් නිර්වචනය කරන්න.

08. පොදු ශ්‍රවණ ඌනතා වර්ග ලැයිස්තුගත කර, ඉන් එකක් පැහැදිලි කරන්න.

(ලකුණු 05 x 08 = 40)

## 2 වන කොටස

09\. (i) ඔටිසම් පරාසීය අක්‍රමතාව සහිත සිසුන් ගුරුවරයෙකුට හඳුනාගත හැකි ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 08)

(ii) ඔටිසම් පරාසීය අක්‍රමතාව සහිත සිසුන්ට අන්තර්කරණ පන්ති කාමරයකදී අධ්‍යාපනික සහය ලබාදිය හැකි ආකාරය විස්තර කරන්න. (ලකුණු 12)

10\. (i) 'බුද්ධිමය දුබලතාවය' ඔබේ වචනයෙන් නිර්වචනය කරන්න. (ලකුණු 08)

(ii) "පුද්ගලයෙකුට බුද්ධිමය දුබලතාවය පවතී ද යන්න තීරණය කිරීමේ දී බුද්ධි මට්ටම් ලකුණු (IQ ලකුණු) එක් අංගයක් පමණක් බව සහ ඒ සඳහා අනුවර්ති චර්යා කුසලතාවල සැලකිය යුතු සීමාවක් ද අවශ්‍ය බව සිහියේ තබා ගැනීම වැදගත් වේ."

(අ) අනුවර්ති චර්යාවලට අදාල අනුවර්ති කුසලතා පැහැදිලි කරන්න. (ලකුණු 06)

(ආ) අධ්‍යාපන ක්ෂේත්‍රයේ හඳුනාගත් බුද්ධිමය දුබලතාවය සහිත සිසුන්ට සාර්ථකව ඉගැන්වීම සඳහා ක්‍රියාත්මක කළ හැකි ක්‍රමවේද පරීක්ෂා කරන්න. (ලකුණු 06)

11\. "බොහෝ දරුවන්ගේ කථනය සහ භාෂාව ඉතා ස්වාභාවික සහ පුරෝකථනය කළ හැකි අනුක්‍රමික ආකාරයෙන් සංවර්ධන වේ."

(i) කථන අක්‍රමතා හා භාෂා අක්‍රමතා අතර වෙනස විස්තර කරන්න. (ලකුණු 08)

(ii) කථන සහ භාෂා අක්‍රමතා සම්බන්ධ සමාජ චිත්තවේගීය ගැටලු පැහැදිලි කරන්න. (ලකුණු 04)

(iii) පාසල් යන වයසේ දරුවන්ට බලපෑ හැකි කථන අක්‍රමතා වර්ග හතරක් (04) නම් කර, ඔබ සඳහන් කළ එක් කථන අක්‍රමතාවක ලක්ෂණ පැහැදිලි කරන්න. (ලකුණු 08)

12. "චර්යා අක්‍රමතා විනිශ්චය අපහසුය. නිරීක්ෂණය කළ හැකි හෝ මැනිය හැකි ශාරීරික විෂමතාවල භෞතික රෝග ලක්ෂණ නොමැත."

(i) චර්යා අක්‍රමතා වර්ග තුනක් (03) සඳහන් කර එම චර්යා පාලනය කිරීමේ දී ඔබට මුහුණ දීමට සිදුවිය හැකි අභියෝග පැහැදිලි කරන්න. (ලකුණු 08)

(ii) වඩා හොඳ පන්ති කාමර කළමනාකරණයක් සඳහා ඉහත සඳහන් අභියෝග ජය ගැනීමට ඔබට යොදාගත හැකි උපාය මාර්ග විස්තර කරන්න. (ලකුණු 12)

13. (i) දුබලතා සහිත පුද්ගලයින්ගේ අධ්‍යාපන පනතට අනුව USA-IDEA (1990) පහත සඳහන් යෙදුම් නිර්වචනය කරන්න.

(a) ශ්‍රවණ ඌනතා (b) බිහිරි බව (ලකුණු 08)

(ii) ශ්‍රවණ ඌනතා සහිත දරුවන් තුළ ඔබට නිරීක්ෂණය කළ හැකි චර්යා වෙනස්වීම් සහ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ඔවුන්ට උපකාර කිරීමට ඔබ විසින් භාවිතා කරනු ලබන උපාය මාර්ග මොනවාද යන්න පරීක්ෂා කරන්න. (ලකුණු 12)

14. (i) a) ගුරුවරයෙකු ලෙස ඔබ ඔබේ පන්ති කාමරයේ ඩිස්කැල්කියුලියා (Dyscalculia) ගණිත දුබලතාව සහිත දරුවෙකු හඳුනා ගන්නේ කෙසේ ද?

b) ඉහත සඳහන් කළ එවැනි සිසුන් අතර ඔබට දැකිය හැකි ප්‍රධාන ලක්ෂණ පැහැදිලි කරන්න. (ලකුණු 08)

(ii) ඔබ ඩිස්කැල්කියුලියා (Dyscalculia) සහිත සිසුන්ට ඉගැන්වීමේ දී මුහුණ දෙන අභියෝග මොනවා ද? එවැනි සිසුන් සඳහා ඔබ විසින් ක්‍රියාත්මක කරනු ලබන මැදිහත්වීමේ සැලසුම පැහැදිලි කරන්න. (ලකුණු 12)

හිමිකම් ඇවිරිණි.